

# අපේ පොඩි හිච්චියා

අපේ ගෙදර පොඩි හිච්චියෙක් ඉන්නවා . එයාගේ නම ටෙනුලි . ඒ හිච්චියා හැමදාම අඬනවා. අම්මගේ කුක්කු එක හැමදාම ඉල්ලනවා. හප හපා තමයි බොන්නෙ .ඒ හිච්චියා කක්කි දාන්නෙම නෑ .අම්ම ආස නෑ එතකොට . ඔන්න හිච්චිය අඬනවා දැන් .මොකක්ද කරන්නෙ ?.හිච්චි කුක්කු බොනකොට හපනවානේ .එතකොට අම්මා පව්

"හා හා හිච්චි දැන් දොය්යන්න .දොය්.. දොය්" .අනේ බෑනේ .හිච්චි දොය්යන්නේ නෑ .ඔන්න හිච්චි දඟලනවා අම්මගේ ඔඩොක්කුවෙ .හිච්චිට සෙල්ලම් කරන්න ඕන. ඔන්න හිච්චි හිනා වෙනවා .හිනාවෙනකොට දොය්යන්න බෑ .

කව්රුහරි ඉන්නවද හිච්චිව නලවන්න.හිච්චි චුටිනේ.දඟලන්නමයි ඕන .කොහොමද හිච්චිව දොය් කරන්නේ.මමනම් දන්නේ නේ.හිච්චි දඟකාරී. අපේ අම්මට ඕන හිච්චිව නලවන්න.දොය් කරන්න.කොහොමද හිච්චිව දොය් කරන්නේ? මම නම් දන්නේ නෑනේ.

අපේ ගෙදර ඉන්නේ අම්මයි ,තාත්තයි ,මමියි,මල්ලියි, හිච්චියයි විතරයි.කාටවත් බෑ හිච්චිව නලවන්න.කොහොමද මේක කරන්නේ?

"හරි,මම දන්නවා හිච්චිව දොය් කරවන හැටි. හිච්චි දඟයිනේ.එයාට ඕන සෙල්ලම් කරන්න.ඔන්න මම හිච්චි එක්ක සෙල්ලම් කරනවා.එතකොට එයාට ගොඩාක් මහන්සිවෙයි. ඊටපස්සේ නිදාගනියි" ඔන්න හිච්චි සෙල්ලම් කරනවා.

"ඒයි ,ඒයි" මල්ලි කියනවා "ඒක හොඳ අදහසක් නෙමේ. හිච්චියට ගොඩක් ආසයි සෙල්ලම් කරන්න.එයාට මහන්සි නෑ."

"ඉන්න,ඉන්න,. මම දන්නවා හිච්චිව දොය් කරවන්න. හිච්චිව දාන්න තොටිල්ලට." තාත්ති කියනවා.
අම්ම කියනවා "එහෙම බෑ .හිච්චිව වැටෙයි" කියලා "නෑ නෑ ,එයාට පනින්න බෑ.තොටිල්ලේ වැට ගොඩක් උසයි" තාත්ති කියනවා.අනේ ඔව්.හොඳයි අදහස.එහෙනම් හිච්චිව තොටිල්ලේ තියමු.ඔන්න තිබ්බා තොටිල්ලෙන්.එයා අඬනවා. අනේ පව්.මොකද කරන්නේ?

"ඔහොම තියන්න" තාත්ති කියනවා.

එයා අඬනවා. තවත් අඬනවා .ගොඩාක් අඬනවා .

"ආ ආ ආ .මොකක්ද ඒ ?සද්දේ නෑනේ".මල්ලි කියනවා. බලමු, බලමු.සද්ද කරන්න එපා. ඕ. ඕ. හිච්චි නිදි.

කතාව කිව්වේ
නෙතුලි බණ්ඩාර වයස අවුරුදු 7
ලිව්වේ - පද්මිණී බණ්ඩාර



Sauymi Hemachandra
3 years



Ramiru Kandambi.
Grade 3 Epping View Primary School



සුනිල්

ජිප්සීස් සුනිල් දශක කිහිපයක් තිස්සේ මේ රටේ සංගීත සහ ප්‍රාසාංගික කලාව තුළ යම් වෙනස් යමක් කිරීමට උත්සාහ කළ සම්ප්‍රදායික නොවන සංගීත කණ්ඩායමක් සහ ගායකයෙකි. සුනිල් ඔහු ජීවත්වන සමාජයේ දේශපාලනය ආර්ථිකය සහ සංස්කෘතිය සිය ගීතයෙන් කලාවෙන් ඉදිරිපත් කරණු ලබයි. මෙම ගීත විටෙක උපහාසාතත්මකය. විටෙක අමුය. විටෙක තිත්තය. මේ සියල්ල ඔහු සමාජයීය සාමාජිකයෙකු ලෙස සිට සංගීතය සහ ප්‍රසාංගික ඉදිරිපත් කිරීම තුළ සිට ජනතාවට, රසිකයාට සහ රසිකයින් නොවන අයට ද බෙදා දෙයි .පසුගියදා සිදුවූ එවන් සිදුවීමක් නිසා සුනිල් පෙරේරා බොහෝ දෙනෙකුගේ අවධානයට පාත්‍රවිය.

ලෝකෙන් උතුම් රට ලංකාව බැවින් සුද්දන්ට ටියුෂන් ගන්න ලංකාවට එන්න කියන්න සුනිල් ට හැකියාව ලැබිණි. ක්‍රිකට් සම්මාන රාත්‍රියේදී සුනිල් පැමිණ සිටි ක්‍රිකට් නිළධාරීන්ටත් ක්‍රීඩකයන්ටත් හරි අපූරු දේවල් ප්‍රසාංගිකව කියා දැම්මේය.

ක්‍රිකට් යනු මේ රටේ ප්‍රේක්ෂකයන් වැඩි දෙනෙක් නරඹන මෙන්ම ක්‍රීඩාව වෙයි. එමෙන්ම ක්‍රිකට් ක්‍රීඩකයන් තරම් මුදල් උපයන වෙනත් ක්‍රීඩකයන් මේ රටේ තවත් නැත. ඒ මදිවාට ක්‍රිකට් පරිපාලකයන්ද ඒ හා සමාන තවත් අයද මේ තුළින් විශාල ගසාකෑම් කරමින්, අයථා ලෙස මුදල් පරිහරණය කරමින් ජීවත්වන බව, සැප විඳින බව නොරහසකි. මේ යථාර්ථය කලාකරුවකුට සමාජ ගත කිරීමේ නිදහස තිබේ. එය අමුද, තිත්තද, පැණි රසද යන්න ගැටළුවක් නොවේ.

එහෙයින් සුනිල් කියන්නට ඇතිදේ ගේ ඇතුළටම ගොස් සංගීතයෙන් සහ කලාවෙන් ඉදිරිපත් කර තිබේ. ඒ සුනිල් ගේ හැටිය.

සුනිල් මෙහිදී ගැයූ ගීයේ රතුපස්වල වතුර සම්බන්ධයෙන් බලධාරීන් ජනතාවට වෙඩි තිබ්බෙ මොන රටේද? කියා අසන විට අමෙරිකාවේ බව ගෝලයෝ ටික පවසයි.

සාධාරණ ජන්දයක් තියන්නෙ මොන රටේද කියා අසන විට ලංකාවේ කියා ගෝලයෝ ටික පවසයි.

අග්‍රවිනිශ්වයකාරවරියන් ගෙදර යවන්නේ මොන රටේද කියා අසයි ගෝලයෝ එය එංගලන්තයේ සිදුවන බව පවසයි.

දයාවෙන් සිරියාවෙන් දේශපාලකයො බල්ටි ගහන්නෙ කොයි රටේද කියා සුනිල් විමසයි ගෝලයෝ එංගලන්තයේ කියා පවසයි........

සුනිල් මේ ගීත කලාවෙන් කතා කරණුයේ මේ සමාජයේ පවතින සහ සිදුවූ සියල්ලයි . මෙය ගීත කලාවේ, ප්‍රසාංගික කලාවේ වාර්ථාමය ස්වරූපයයි . මේවා වේදිකාවකට නැග විපක් ෂය රැස්වීම් දහයකට ගොස් පවසා කෑ මොර දෙනවාට වඩා සුනිල් විසින් ඉදිරිපත් කරණ ලද මෙම ප්‍රසාංගික විනාඩි 15ව මේ රටේ සුවහසක් ජනතාව අතර කතාබහට මෙන්ම, ඉහළ නිලධාරීන් අතර, විවිධ කණ්ඩායම් අතර, සිවිල් පොරවල් අතර සහ අන්තර්ජාලයේ සැරි සරණ තරුණ ප්‍රජාව අතරද වේගයෙන් සන්නි-වේදනය වී තිබේ.



මේ පිළිබඳව කතාබහ කරන්නට, මේ පනිවිඩය බෙදා ගන්නට උත්සුක වී තිබේ . මේ පහර ගැසීම දේශපාලනික වන බැවින්, ප්‍රසාංගික වන බැවින්, සංගීතාත්මක වන බැවින් සුනිල් ට බොහෝ අයගේ කැමැත්ත ප්‍රකාශ වී තිබේ . මේ හේතුවෙන් සුනිල් රසිකයින් අතර තවදුරටත් සිය අනන්‍යතාව තහවුරු කරගනිමින් සිටී.

අද වනවිට කලාකරුවන්ට අනන්‍යතාවක් නැති තැනට කටයුතු සිදුව ඇති බව ද සුනිල් පෙන්වා දෙයි. ස්වාධීන කලාකරුවන් වැඩිපුරම සිටින්නෙ මොන රටේද කියා සුනිල් අසයි. ගෝලයෝ ලංකාවේ බව පවසයි. කඬේ යන කලාකරුවෝ ඉන්නෙ අමෙරිකාවේ බව ගෝලයෝ පවසයි. ජැක්සන් වඩාත්ම කඬේ යන්න පටන්ගෙන ඇති බව ද පවසයි. ඒමෙන්ම සිංදු කියන්න ස්ටේජ් වලට නැග්ගහම මයික් එකට රන්ඩුවෙලා සිංදු කියන්න පොරකන්නෙ ත් අමෙරිකාවේ බව පවසයි. මේවා තිත්තය. නමුත් ඇත්තය.

සමස්ථ කලාකරුවෝ තම විෂය පථය තුළ තමාගේ අවට සිදුවන දේ පිළිබඳව විචාර බුද්ධියෙන් විමර්ෂණය කළ යුතුව ඇත. ලංකාවේ කලාකරුවන් වන්දිබට්ටයන් වී සිටීම, නිහඬව සිටීම සහ ඇග බේරා ගෙන සිටීම නිසා සුනිල් ලාට මේ ලෙස හුදකලාව ගයන්නට, ඉදිරිපත්වන්නට, කියන්නටසිදුව තිබේ.

http://mirrorarts.lk/
සුනිල් ගේ ගීය www.sannasa.net වෙතින් අසන්න